# 2021 සම්පත් පැතිකඩ



දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හම්බන්තොට

***ස්තූතිය ........!***

මෙම වාතර්ාව සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාදුන්

සියළුම අංශ හා ආයතන ප්‍රධානින්

හා සහාය දුන් සැමට.

**සැකසුම :** දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කායර්ාලය

හම්බන්තොට.

**හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය දැක්ම සහ මෙහෙවර**

## දැක්ම

"කාර්යක්ෂම දිස්ත්‍රික් පරිපාලනයක් තුලින් විශිෂ්ඨතම මහජන සේවාවක්"

## මෙහෙවර

"ජනතා අවශ්‍යතා කාර්යක්ෂමව, සාධාරණව, යුක්තිගරුකව හා මිත්‍රශීලීව ඉටුකරමින් රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව මනා සම්පත් කළමනාකරණය හා සම්බන්ධීකරණය තුලින් දිස්ත්‍රික්කය තුළ තිරසාර සංවර්ධනයක් තහවුරු කිරීම."

**පෙරවදන**

විශේෂයෙන්ම රටක් සංවර්ධනය කරා යන ගමනේදී, නිවැරදි තොරතුරු පද්ධතිය සංවර්ධන අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීමෙහිලා සුවිශේෂී කාර්යභාරයක් ඉටු කරනු ලබයි.නිවැරදි තොරතුරු වනාහි සංවර්ධන සැලසුම් පිළියෙල කරන්නන්ට සංවර්ධනයේ ප්‍රමුඛ අරමුණු හඳුනාගනිමින් බිම් මට්ටමේ සිට ඉහළට සැලසුම් උපායමාර්ග සකස් කිරීමටත් මහජන අවශ්‍යතා මැනවින් හඳුනාගත් ඵලදායී සංවර්ධන සැලසුම් පිළියෙල කිරීමටත් උපකාරීවන්නා වූ කේන්ද්‍රීය සාධකයවන අතර ප්‍රමාණාත්මක හා ගුණාත්මක සංවර්ධනය කෙරෙහි එය මනා පිටුවහලක් වේ.

ඒ අනුව හම්බන්තොට දිස්ත්‍රික් සංවර්ධන ක්‍රියාවලිය හා සම්බන්ධ දේශපාලන නායකත්වය,නිලධාරීන්, ප්‍රතිලාභීන්, සහාය කණ්ඩායම් හා විවිධ ආයතන යනාදී සියළු පාර්ශවයන්ට අවශ්‍ය තොරතුරු පහසුවෙන් හා කඩිනමින් ලබා දීමේ අරමුණින් හම්බන්තොට දිස්ත්‍රික් සම්පත් පැතිකඩ නිමර්ාණය කරන ලද අතර එහි පළමු පරිච්ඡේදය තුළින් දිස්ත්‍රික්කය පිළිබඳ මූලික හැඳින්වීමක් කරනු ලබයි.

දෙවන පරිච්ඡේදය තුළින් දිස්ත්‍රික්කයේ සමස්ථ ජනගහන තොරතුරු විවිධ පැතිකඩයන් ඔස්සේ ඉදිරිපත් කරනු ලබන අතර තුන්වන පරිච්ඡේදය තුළින් දිස්ත්‍රික්කයේ ආර්ථික,වෙළඳ හා කමර්ාන්ත තොරතුරු විවිධ අංශ අනුව විවරණය කරයි. සිව්වන පරිච්ඡේදය දිස්ත්‍රික්කයේ ඉඩම් පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරනු ලැබේ.හම්බන්තොට දිස්ත්‍රික්කයේ සමාජ ශුභසාධන හා පොදු යටිතල පහසුකම් පිළිබඳව පස්වන පරිච්ඡේදයේදී ඉදිරිපත් කරන අතර අවසාන වශයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පවතින විභව සම්පත්, දිස්ත්‍රික්කය සංවර්ධනය කරා යන ගමනේදී මුහුණපා ඇති ගැටළු,අදාල ගැටළු සඳහා විසඳුම් සහ යෝජනා හයවන පරිච්ඡේදයේදී සාකච්ඡා කරනු ලැබේ.

## පටුන

1.0 හම්බන්තොට දිස්ත්‍රික්කය.......................................................................................................... 1


1.1 දිස්ත්‍රික් සිතියම........................................ 1
1.2 හැදින්වීම........................................ 2
1.3 ඓතිහාසික තොරතුරු........................................ 2
1.4 භෞතික පරිසරය........................................ 3
1.5 දේශගුණික ලක්ෂණ........................................ 5
1.6 හම්බන්තොට දිස්ත්‍රික්කයේ මූලික තොරතුරු........................................ 6
2.0 ප්‍රජාවිද්‍යාත්මක තොරතුරු........................................ 7
2.1 ජනගහන තොරතුරු........................................ 7
2.2 වයස් කාණ්ඩ අනුව ජනගහන ව්‍යාප්තිය........................................ 9
2.3 ආගම් අනුව ජනගහනය........................................ 13
2.4 ජාතීන් අනුව ජනගහනය........................................ 15
2.5 විදේශගත ජනගහනය........................................ 17
2.6 භූමි ප්‍රමාණය, ජන ගහනය හා ජන ඝනත්වය........................................ 19
2.7 ප්‍රදේශ අනුව ජනගහන ව්‍යාප්තිය........................................ 20
2.8 ආබාධිත ජනගහනය........................................ 21
2.9 ආදායම් මට්ටම අනුව පවුල් සංඛ්‍යාව........................................ 22
2.10 ලියාපදිංචි ඡන්ද දායකයන් සංඛ්‍යාව........................................ 23
2.11 සේවා නියුක්තිය / වියුක්තිය රැකියා අනුව ජනගහනය........................................ 24
2.12 ආධාර ලබන පවුල් සංඛ්‍යාව........................................ 25
2.13 නිවාස තත්වය........................................ 26
2.14 වහල සෙවිලි කර ඇති ආකාරය අනුව නිවාස සංඛ්‍යාව........................................ 27
2.15 බලශක්ති භාවිතය අනුව නිවාස සංඛ්‍යාව........................................ 28
2.16 පානීය ජල පහසුකම් අනුව නිවාස සංඛ්‍යාව........................................ 29
2.17 සනීපාරක්ෂක පහසුකම් භාවිතය අනුව පවුල් සංඛ්‍යාව........................................ 30
2.18 දුරකථන භාවිතය පිළිබඳ තොරතුරු........................................ 31
3.0 ඉඩම්, කෘෂිකාමරීක,සත්ව හා ධීවර කමර්ාන්තය පිළිබඳ තොරතුරු........................................ 32
3.1 ඉඩම් පරිහරණය පිළිබඳ තොරතුරු........................................ 32
3.2 කැබලි අනුව ඉඩම් භාවිතය........................................ 34
3.3 අයිතිය අනුව ඉඩම්වල ව්‍යාප්තිය (අක්කර)........................................ 35
3.4 කෘෂි කාමරීක කටයුතු (වගාවන් පිළිබඳ තොරතුරු)........................................ 36
3.5 වාරි යෝජනා ක්‍රම අනුව වී වගාව........................................ 38
3.6 සත්ව නිෂ්පාදන තොරතුරු........................................ 39
3.7 ධීවර කමර්ාන්තය පිළිබඳ තොරතුරු........................................ 40
3.8 ධීවර යාත්‍රා පිළිබඳ තොරතුරු........................................ 41
3.9 වැව් පිළිබඳ තොරතුරු........................................ 42
4.0 ආර්ථික,වෙළඳ හා කමර්ාන්ත පිළිබඳ තොරතුරු........................................ 43
4.1 වෙළඳ ආයතන පිළිබඳ තොරතුරු - I........................................ 43
4.2 වෙළඳ ආයතන පිළිබඳ තොරතුරු - II........................................ 44
4.3 කමර්ාන්ත හා ආයතන පිළිබඳ තොරතුරු - I........................................ 45
4.4 කමර්ාන්ත හා ආයතන පිළිබඳ තොරතුරු - II ........................................ 46
4.5 කමර්ාන්ත හා ආයතන පිළිබඳ තොරතුරු - III........................................ 47
4.6 කමර්ාන්ත හා ආයතන පිළිබඳ තොරතුරු - IV........................................ 48
4.7 කොට්ඨාශයේ ඇති වාහන - I ........................................ 49


4.8 කොට්ඨාශයේ ඇති වාහන - II.................................................................................... 50
5.0 සමාජ සුහසාධන හා පොදු යටිතල පහසුකම් ........................................................................ 51
5.1 පාසල් පිළිබඳ තොරතුරු.................................................................................... 51
5.2 පෙර පාසල් පිළිබඳ තොරතුරු.............................................................................. 52
5.3 ආගමික ස්ථාන පිළිබඳ තොරතුරු.......................................................................... 53
5.4 දහම් පාසල් පිළිබඳ තොරතුරු.............................................................................. 54
5.5 පිරිවෙන් පිළිබඳ තොරතුරු.................................................................................. 55
5.6 පෞද්ගලික පුහුණු ආයතන පිළිබඳ තොරතුරු............................................................ 56
5.7 වෘත්තීය පුහුණු ආයතන පිළිබඳ තොරතුරු............................................................... 57
5.8 අධ්‍යාපන මට්ටම පිළිබඳ තොරතුරු ......................................................................... 58
5.9 විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් පිළිබඳ තොරතුරු ................................................... 59
5.10 සෞඛ්‍ය පහසුකම් පිළිබඳ තොරතුරු........................................................................ 60
5.11 පොදු ස්ථාන පිළිබඳ තොරතුරු............................................................................ 61
6.0 ස්වේච්ඡා සංවිධාන පිළිබඳ තොරතුරු............................................................................ 62
6.1 රාජ්‍ය නොවන සංවිධාන පිළිබඳ තොරතුරු.............................................................. 62
6.2 ගොවි සංවිධාන පිළිබඳ තොරතුරු........................................................................ 63
6.3 ග්‍රාම සංවධර්න සමිති පිළිබඳ තොරතුරු.................................................................. 64
6.4 වැඩිහිටි සමිති පිළිබඳ තොරතුරු........................................................................... 65
6.5 ධීවර සමිති පිළිබඳ තොරතුරු.............................................................................. 66
6.6 කාන්තා සමිති පිළිබඳ තොරතුරු........................................................................... 67
6.7 යෞවන සමාජ පිළිබඳ තොරතුරු.......................................................................... 68
6.8 ළමා සමාජ පිළිබඳ තොරතුරු.............................................................................. 69
6.9 මරණාධාර සමිති පිළිබඳ තොරතුරු........................................................................ 70
6.10 ක්‍රීඩා සමාජ පිළිබඳ තොරතුරු............................................................................. 71
6.11 කලායතන පිළිබඳ තොරතුරු............................................................................... 72
6.12 වැඩිහිටි නිවාස පිළිබඳ තොරතුරු......................................................................... 73
6.13 කොට්ඨාශ මට්ටමින් රජයේ ආධාරලාභීන් පිළිබඳ තොරතුරු......................................... 74

**ඇමුණුම - 01** හම්බන්තොට දිස්ත්‍රික්කයේ ඇති විභව සම්පත් පිළිබඳ තොරතුරු

# 1.0 හම්බන්තොට දිස්ත්‍රික්කය

## 1.1 දිස්ත්‍රික් සිතියම




## 1.2 හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ගිණිකොණ දිග සීමාවේ පිහිටා ඇති හම්බන්තොට දිස්ත්‍රික්කය විශාලත්වයෙන් වගර් කි.මී. 2609කි. මෙය දිවයිනේ මුළු භූමි ප්‍රමාණයෙන් 1/25ක් පමණවන අතර දිස්ත්‍රික්කයේ උපරිම දිග කි.මී. 106ක්ද උපරිම පළල කි.මී.39ක්ද වේ. දිස්ත්‍රික්කයට අයත්වන වෙරළබඩ තීරයේ දිග කි.මී. 151කි.අක්ෂාංශගත හා දේශාංශගත පිහිටීම අනුව හම්බන්තොට දිසත්‍රික්කය උතුරු අක්ෂාංශ 6.0 සිට 6.5දක්වාද නැගෙනහිර දේශාංශ 80.6 සිට 81.7 දක්වාද විහිදී ඇත. උතුරින් මොණරාගල හා රත්නපුර දිස්ත්‍රික්කවලින්ද බටහිරින් මාතර දිස්ත්‍රික්කයෙන්ද දකුණින් ඉන්දියන් සාගරයෙන් හා නැගෙනහිරින් ඉන්දියන් සාගරයෙන් හා අම්පාර දිස්ත්‍රික්කයෙන් මෙම දිස්ත්‍රික්කය මායිම් වී ඇත.

පරිපාලනමය වශයෙන් හම්බන්තොට දිස්ත්‍රික්කය ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශ 12කටද ග්‍රාම නිලධාරී වසම් 576කට ද බෙදා ඇති අතර දිස්ත්‍රික්කයේ මුළු ජනගහනය 2021 වෂර්ය සඳහා 724848 ක් වන අතර ඉන් 367826 ක් ස්ත්‍රී ජනගහනයවන අතර 357022 ක් පුරුෂ ජනගහනය වේ. දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණය වගර් කි.මී.2,609 ක් වන අතර ඒ අනුව ජන ඝනත්වය වගර් කිලෝමීටරයට 2305.06 ක් වේ.

**1.3 ඓතිහාසික තොරතුරු**

හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශය ලක් ඉතිහාසයේ ශ්‍රේෂ්ඨ සංස්කෘතියකට හා ශිෂ්ටාචාරයකට පදනම් වූ භූමි ප්‍රදේශයක පිහිටි ඓතිහාසික රෝහණ රාජ්‍යයේ කොටසක්වන අතර නිවහල් ජාතියක් අදීන සභ්‍යත්වයක් හා නිමර්ල බෞද්ධ සංස්කෘතියක් ගොඩනැංවීමෙහිලා මෙම ප්‍රදේශය සුවිශේෂී මෙහෙවරක් ඉටු කර ඇත.අනුරාධපුර හා පොළොන්නරු රාජධානි දකුණු ඉන්දීය ආක්‍රමණිකයන්ට යටත් වූ අවස්ථාවල දුටුගැමුණු, ධාතුසේන, විජයබාහු වැනි නරපතියනට හෙළය එක්සේසත් කිරීමට රුහුණු ජනතාව සුවිශේෂී මෙහෙවරක් ඉටු කරන ලද අතර බුදු සසුන විනාශ මුඛයට ගිය අවස්ථාවල එය රැකගැනීමට රුහුණු වෙහෙර විහාර උර දී ඇති අතර අනුරාධපුර රාජධානියේ ජනතාව සාගතයට මුහුණ දුන් අවස්ථාවලදී මෙන්ම ජාතික නිදහස පතා හෙළයන් සටන් වැදුන අවස්ථාවලදි ද ඔවුනට බත සැපයුනේ රුහුණු කෙත් බිම්වලිනි. නයිගල, මුල්ගිරිගල,කොන්දගල යන වෙහෙරගල,මල්අස්නගල,මත්තල, පඩව්ගම වැනි ස්ථානවලින් හමු වූ ඓතිහාසික තොරතුරුවලින් මේ බව මැනවින් සනාථ වේ.

යටත්විජිත සමය තුළ බ්‍රිතාන්‍යයන් හම්බන්තොට වරායක් වශයෙන් හා නාගරික මධ්‍යස්ථානයක් වශයෙන් තව දුරටත් දියුණු කරන ලද අතර ඒ අනුව හම්බන්තොට නගරය තුළ කච්චේරියක්, රජයේ දෙපාතර්මේන්තුවල කායර්ාල රැසක්,පාසල්,පොලිස් ස්ථානයක්,රෝහලක් හා උසාවියක් ස්ථාපනය කොට දිස්ත්‍රික්කයේ ප්‍රධානම පරිපාලන නගරය බවට හම්බන්තොට පත් කරන ලදි. බ්‍රිතාන්‍ය යුගයේදී හම්බන්තොට දිස්ත්‍රික්කය බටහිර ගිරුවා පත්තුව (ගම්මුලදැනී වසම් 72), නැගෙනහිර ගිරුවාපත්තුව (ගම්මුලදෑනී වසම් 36), මාගම්පත්තුව (ගම්මුලාදැනි වසම් 28) වශයෙන් කොටස් 03කට බෙදී පැවති අතර භූමි ප්‍රමාණය අනුව විශාලත්වයෙන් වැඩිම වූයේ මාගම්පත්තුවයි. මහාචායර් සෙනරත් පරණවිතානයන්ට අනුව “හම්බන්” නමැති මැලේ යාත්‍රාවන් මෙහි පැමිණි නිසා හම්බන්තොට යන නම මෙම මුහුදු තොටට ලැබී ඇති බව කියැවේ.

## 1.4 භෞතික පරිසරය

**ස්වාභාවික වෘක්ෂලතා සහ වනාන්තර**

දිස්ත්‍රික්කයේ වෘක්ෂලතා සහ වනාන්තර සම්බන්ධයෙන් සලකා බැලීමේදී ශුෂ්ක රූපී කටු පඳුරුවලින් යුක්ත වන ලැහැබ් වැඩි වශයෙන් දැකිය හැකි අතර මෙම වන ලැහැබ් තුළ පලු, කටු අන්දර, පතොක්, කුඹුක්, එරමිණියා, මංසල, රණවරා,හාතවාරියා වැනි ශාක බහුල වේ. වලස්මුල්ල,ඕකෙවෙල,කටුවන ආදී ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයන්හි ඇතැම් ප්‍රදේශ ආශ්‍රිතව තෙත් කලාපීය ලක්ෂණද මද වශයෙන් දක්නට ලැබෙන බැවින් තෙත් කලාපයට ආවේණික වෘක්ෂලතාවන තේක්ක,බුරුත,නැදුන්,මාර වැනි ශාඛ බහුල වශයෙන් එම ප්‍රදේශ යන් ආශ්‍රිතව දැකිය හැක. අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය ආශ්‍රිතව කඩොලාන ශාඛ ව්‍යාප්තියද යම් ප්‍රමාණයකට දැකිය හැක.

**භූ විෂමතාවය**

භූ විෂමතාවය අනුව බලන විට හම්බන්තොට දිස්ත්‍රික්කය රැළි සහිත තැනිතලා භූමිය වැඩි වශයෙන් දක්නට ලැබෙන නමුත් නයිගල, කසාගල, මුල්ගිරිගල, වෙහෙරගල, මදූනාගල, කරඹගල වැනි ශේෂ කඳුද දිස්ත්‍රික්කයේ තැනින් තැන දක්නට ලැබේ.

බටහිරින් කුඩාවැල්ලේ සිට නැඟෙනහිර පට්ටනංගල දක්වා විහිදුන හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් වෙරළ තීරය දශර්නීය වෙරළබඩ ලක්ෂණ රැසකින් සමන්විත වේ. ඒ අතර තුඩු, කලපු,බොකු,වැලිපර,මුහුදු දඹ සහ ගංමෝය වැනි ලක්ෂණ වැදගත්ය. ඊට අමතරව ධීවර කමර්ාන්තය සම්බන්ධයෙන් වැදගත්වන වරාය, තොටුපල හා කළපුවලට විශේෂ ස්ථානයක් හිමි වේ. නවීන පහසුකම් සහිත ධීවර වරායන් ලෙස කුඩාවැල්ල,තංගල්ල,හම්බන්තොට හා කිරින්ද වරායන් සංවධර්නය කර ඇති අතර ඊට අමතරව ධීවර කටයුතු සඳහා භාවිතා කෙරෙන කුඩා වරායන් හා කලපු රැසක්ද ඇත.ජාතික ලුණු නිෂ්පාදනයට බෙහෙවින් දායක වන හම්බන්තොට මහ ලේවාය,කොහොලංකල ලේවාය හා පලටුපාන ලේවාය වැනි ලේවායන් කිහිපයක්ද මෙම දිස්ත්‍රික්කයේ පිහිටා ඇත.

මීට අමතරව හම්බන්තොට දිස්ත්‍රික්කයට අයත් තංගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි හුම්මානය,සූරියවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි උණුදිය උල්පත්,අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ පිහිටි උස්සන්ගොඩ මෙරට දක්නට ලැබෙන දුලර්භ භූ විද්‍යාත්මක ලක්ෂණයන් වේ.

**ජලවහනය**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජල වහන රටාව සමන්විතවන ප්‍රධාන ගංගා සහ ස්වාභාවික ජල මාගර් පහත වගුව තුළින් නිරූපණය වේ.

| අ.අ | ගංගාව/ස්වාභාවික ජල මාගර්ය | දිග(සැතපුම්) |
|---|---|---|
| 1 | සීනිමෝදර ඔය | 5 |
| 2 | කිරම ඔය | 20 |
| 3 | රැකව ඔය | 4 |
| 4 | උරුබොකු ඔය | 26 |
| 5 | කච්චිගල් ආර | 13 |
| 6 | වලවේ ගඟ | 85 |
| 7 | කරගන් ඔය | 45 |
| 8 | මලල ආර | 34 |
| 9 | ඇඹිලිගල් ඔය | 85 |
| 10 | කිරිඳි ඔය | 73 |
| 11 | දඹාවේ ආර | 35 |
| 12 | මහ සිලාවේ ඔය | 8 |
| 13 | භූතව ඔය | 8 |
| 14 | මැණික් ගඟ | 71 |
| 15 | කටුපල ආර | 11 |
| 16 | කරැන්ද ආර | 16 |
| 17 | නමඩගස් ආර | 4 |
| 18 | කරඹෙ ආර | 3 |
| 19 | කුඹුක්කන් ඔය | 72 |

මෙ අතරින් වලවේ ගඟ, කිරිඳි ඔය හා කච්චිගල් ආර මෙන්ම දිස්ත්‍රික්කයේ නැඟෙනහිර මායිමේ පිහිටි කුඹුක්කන් ඔය ද ප්‍රධාන ජල මාගර් වේ.මාස් කන්නය හෙවත් ඊසාන දිග මෝසම් කාලයේ දී (නොවැ- මාතර්ු) මෙම ගලභාවල ජල මට්ටම ඉහළ යන අතර මාස් කන්නය හෙවත් නිරිත දිග මෝසම් කාලයේ දී (මැයි- සැප්තැම්බර්) ජල මට්ටම පහල බසී.

දිස්ත්‍රික්කයේ ඇති ප්‍රධාන වැව් හා අභ්‍යන්තර ජලාශ 13න් විශාලතම වන්නේ රිදියගම වැව වුවද වැඩිම ජල ධාරිතාවයක් අඩංගු වන්නේ මුරුතවෙල හා ලුණුගම්වෙහෙර යන ජලාශවලය. වැඩිම වැව් ප්‍රමාණයක් තිස්සමහාරාම ප්‍රදේශය ආශ්‍රිතව පිහිටා ඇති අතර දිස්ත්‍රික්කයේ මුළු භූමි ප්‍රමාණයෙන් ව.කි.මි. 11.5 ක් පමණ අභ්‍යන්තර ජලාශවලින් වැසී ඇත.

**පස හා ඛනිජ සම්පත්**

හම්බන්තොට දිස්ත්‍රික්කයේ භූ ව්‍යුහය දෙස බලන විට භූ ඉතිහාසයේ පැරණිම අවධියට අයත් ප්‍රාග් කේම්බ්‍රීය විපරිත පාෂාණ වලින් සමන්විතවන බව පෙනී යන අතර මේවා විජයන් ශ්‍රේණියට අයත් පාෂාණ හා උස් බිම් ශ්‍රේණියට අයත් පාෂාණ වශයෙන් කොටස් 02කි. ගංගා නිම්න දෙපස දියළු අවසාදිත පසතැන්පත්ව ඇති අතර වෙරළබඩ තීරයේ සිප්පි නිධි, වැලි, හුණුගල් තැන්පත්ව ඇත. දිවයිනටම විශේෂ වූ භූමි ලක්ෂණයක් ලෙස අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ වැලිපටන්විල ග්‍රාම නිලධාරී වසමෙහි රතු පසින් යුක්ත තීරය පෙන්වා දිය හැක.එමෙන්ම අම්බලන්තොට,සූරියවැව වැනි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශවල මැණික් නිධි ද දක්නට ලැබේ.

තවද දිස්ත්‍රික්කයේ භූ විෂමතාවය සහ උන්නතාංශය අනුවත් පසෙහි ගැඹුර හා එයට ආවේණික බෑවුම් පන්තිය අනුවත් රතු දුඹුරු පස,හියුමස් අඩු ග්ලේ පස, ඇල්වියල් පස, සොලඩයිස්ඩ් සොලනේඩ්ස් පස, වැලි මිශ්‍ර රෙගොසෝල් පස, ලැටසෝල් පස යනාදී වශයෙන් පාංශු බාණ්ඩ කිහිපයක් හඳුනාගත හැක.

## 1.5 දේශගුණික ලක්ෂණ

වියළි හා අධර් ශුෂ්ක දේශගුණික ලක්ෂණ බහුල මෙම දිස්ත්‍රික්කයේ පාරිසරික හා දේශගුණික විචල්‍යතාවය මනාව පෙන්නුම් කරමින් තෙත් කලාපීය ලක්ෂණද මඳ වශයෙන් දක්නට ලැබේ. දිස්ත්‍රික්කයේ බටහිර සීමාවේ කඳු බෑවුම් දිගේ ඇද හැලෙන කුඩා දියඇළි කිහිපයන් ඇත. අඩි 40 ක් උස බිසෝගල හෙවත් සපුගහදොළ ඇල්ල මේ අතරින් ප්‍රධාන වේ. ප්‍රදේශයේ සාමාන්‍ය උෂ්ණත්වය සෙල්සියස් අංශක 27.8 ක් වන අතර සාමාන්‍යයෙන් වාෂිකව මිලිමීටර 1050 ක පමණ වෂර්ාපතනයක් පතනය වෙයි.

## 1.6 හම්බන්තොට දිස්ත්‍රික්කයේ මූලික තොරතුරු

| | | | | |
|---|---|---|---|---|
| 1. | ජනගහනය | ස්ත්‍රී - 367,826 | පුරුෂ - 357,022 | මුළු ජනගහනය - 724,848 |
| 2. | මුළු පවුල් සංඛ්‍යාව | කාන්තා මූලික - 34,504 | පුරුෂ මූලික - 169,371 | මුළු පවුල් සංඛ්‍යාව - 203,826 |
| 3. | මුළු නිවාස සංඛ්‍යාව | 194,994 | | |
| 4. | සමස්ත භූමි ප්‍රමාණය | ව.කි.මී 2609 | | |
| 5. | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ සංඛ්‍යාව | 12කි. - කටුවන, වලස්මුල්ල, වීරකැටිය, ඕකෙවෙල, බෙලිඅත්ත, තංගල්ල, අඟුණකොළපැලැස්ස, අම්බලන්තොට, හම්බන්තොට, සූරියවැව, තිස්සමහාරාමය, ලුණුගම්වෙහෙර | | |
| 6. | ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව | 576 කි. | | |
| 7. | ගම්මාන සංඛ්‍යාව | 1319 | | |
| 8. | මැතිවරණ කොට්ඨාශ සංඛ්‍යාව | 4කි. - තංගල්ල, තිස්සමහාරාමය, මුල්කිරිගල, බෙලිඅත්ත | | |
| 9. | මහ නගර සභා සංඛ්‍යාව | 1කි.හම්බන්තොට | | |
| 10. | නගර සභා සංඛ්‍යාව | 1කි. තංගල්ල | | |
| 11. | ප්‍රාදේශීය සභා සංඛ්‍යාව | 10කි. - කටුවන, බෙලිඅත්ත, තංගල්ල, අඟුණකොළපැලැස්ස, අම්බලන්තොට, හම්බන්තොට, සූරියවැව, තිස්සමහාරාමය, ලුණුගම්වෙහෙර | | |
| 12. | පොලිස් බල ප්‍රදේශ සංඛ්‍යාව | 13කි. | | |
| 13. | අධ්‍යාපන කලාප සංඛ්‍යාව | 03කි. - වලස්මුල්ල, තංගල්ල, හම්බන්තොට | | |
| 14. | ගොවිජන සේවා බල ප්‍රදේශ සංඛ්‍යාව | 17කි. | | |
| 15. | සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කොට්ඨාශ සංඛ්‍යාව | 10කි. | | |